# පුරප්පාඩු

# මධ්‍යම පරිසර අධිකාරිය

## (මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය)

මධ්‍යම පරිසර අධිකාරියේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර පිරවීම සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයින් වෙතින් අයදුම්පත් භාරගනු ලැබේ.

## 01. පරිසර නිලධාරී තනතුර (MA 5-1)

**අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පහත සඳහන් ක්ෂේත්‍රයන්හි එක් ක්ෂේත්‍රයක උපාධියක් ලබා තිබීම.

- භෞතික විද්‍යාව
- සමාජ විද්‍යාව
- කෘෂි විද්‍යාව
- භූගෝල විද්‍යා (විශේෂ)
- ජීව විද්‍යාව
- පරිසර විද්‍යාව
- ජන සන්නිවේදනය

**වැටුප් පරිමාණය :**

වසර 2020 සිට ක්‍රියාත්මක වන රු. 34,870.00 - 660.00x10 - 755.00x15 - 930.00x11 - 63,025 වැටුප් පරිමාණයක් මෙම තනතුරට හිමිවන අතර, 2016.04.25 දිනැති කළමනාකරණ චක්‍රලේඛ 02/2016 අනුව ඔබට රු. 24,082.00 ක මාසික වැටුප් තලයක පිහිටුවන අතර, මාසිකව රු. 6,186.00 ක ගැලපීම් දීමනාවක්ද ලබාදෙනු ලැබේ.

**වයස් සීමාව :**

අවුරුදු 22-45 අතර විය යුතුය.

**අමතර ප්‍රතිලාභ**

- මාස 10 යක වේතනික වටිනාකම ඇතුලත් ආපද ණය මුදලක හිමිකම
- වෛද්‍ය බිල් සඳහා වෛද්‍ය රක්ෂණ ආවරණය
- වසරේ ඉතිරි වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ප්‍රතිපූර්ණය

**බඳවාගැනීම සිදුකරන ආකාරය**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් www.cea.lk යන වෙබ් අඩවියේ පලකර ඇති ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත 2017.02.06 දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතුය.

දැනටමත් රාජ්‍ය සේවයේ, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත ආයතන ප්‍රධානී මගින් ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු අතර ඉහත සඳහන් වයස් සීමාව අදාළ නොවේ.

සියලුම අයදුම්කරුවන් අයදුම් කරන තනතුර සහ තමාගේ පදිංචි පළාත හෝ තමා සේවය කිරීමට කැමති පළාත ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු අතර, තම අයදුම්පත සමග සහතික කළ උපාධි සහතිකයේ පිටපත **පමණක්** එවිය යුතුය.

ලිඛිත පරීක්ෂණයක් සහ ඊට පසුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. ලිඛිත පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වෙන අතර, පළාත් පදනම / තමාගේ කැමැත්ත අනුව තෝරාගන්නා පළාත අනුව බඳවා ගැනීම් සිදු කරනු ලබයි.

අසම්පූර්ණ හා ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**මධ්‍යම පරිසර අධිකාරිය, "පරිසර පියස", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**
2017.01.20